හිතවත් ශ්‍රී ලාංකික මිතුරනි,

ආයුබෝවන්!

වනක්කම්!

අවුරුදු සමය කියන්නේ හැමෝම තම තමන්ගේ පවුලේ අය, යාලු හිතමිත්‍රාදීන් එක්ක එකතු වෙලා අපේ සිරිත් විරිත් හා සම්ප්‍රදායන් පිළිපදින සමයක්. එය සමගිය, සෞභාග්‍ය සහ සතුට පිරුණු සමයක්. මේ මොහොතේ හම්බන්තොට ඉන්දියානු කොන්සුල් ජනරාල් කාර්යාලය වෙනුවෙන් මම ඔබට සතුට සෞභාග්‍ය පිරුණු සුබ සිංහල හා දමිළ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරනවා!

බලාපොරොත්තු නොවූ COVID 19 තත්වය නිසා අපි සියලුදෙනාම පසුගිය කාලයේ ඉතා දුෂ්කර තත්වයකට මුහුණ දුන්නා. ඒ කෙසේ වෙතත්, ආණ්ඩු දෙකේම ඉහළ තලයේ නිලධාරීන්ගේ හා අපගේ රජයන්වල කාලෝචිත ක්‍රියාමාර්ග විවිධ අභියෝගවලට මුහුණ දෙන්න අපට උදව් උනා. COVID 19 වසංගතයට එරෙහිව සටන් කිරීමේදී ශ්‍රී ලංකා රජයට අවශ්‍ය වෛද්‍ය ආධාර හා එන්නත් ලබාදීමෙන් සහාය වීමට හැකිවීම ගැන අපි සතුටු වෙනවා.

ඒ වගේම මම මෙම අවස්ථාවේ සිහිපත් කරන්න කැමතියි දෙදහස් විසි දෙක අවුරුද්දේ අගෝස්තු පහළව වන විට ඉන්දියාව නිදහස ලබාගෙන වසර 75ක් සම්පූර්ණ කරනවා. අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මහතා මාර්තු දොළොස්වෙනිදා, එම වැදගත් දවසට සති 75 කට කලින් India@75 සැමරුම් උත්සවය ගුජරාටයේ සබරමති ආශ්‍රමයේ දී නිල වශයෙන් ආරම්භ කළා. India@75 සැමරුමේ කොටසක් විදියට, අපි ශ්‍රී ලංකාවේ අපේ මිතුරන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය හා සහයෝගය එක්ක විවිධ උත්සව හා ක්‍රියාකාරකම් පවත්වන්න සැලසුම් කරලා තියෙනවා. නැවත වරක්, ඔබ සැමට සුබ නව වසරක් ප්‍රර්ථනා කරනවා.

ඔබට ස්තුතියි.